පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

ශ්‍රේණිය 08

විෂයය :- කතෝලික ධර්මය I & II

පාසලේ නම : ....................................

ඇතුළත්වීමේ අංකය : ....................

කාලය : පැය 02 යි

## 1 කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

1) ශු ලූක් තුමාගේ ජේසුස් ජේසුස් වහන්සේගේ වංශාවලිය ආරම්භ කරන්නේ,

1. ආබ්‍රහම්ගෙන් ය
2. ආදම්ගෙන් ය
3. දාවිත්ගෙන් ය
4. ස්නාවක ජුවාම්ගෙන් ය

2) "එම්මානුවෙල් " යන්නෙහි අර්ථය

1. එවනු ලැබූ තැනැත්තා
2. දෙවියන් වහන්සේ අප සමඟය
3. ආලේප කළ තැනැත්තා
4. දේව ප්‍රේමය අප සමඟය

3) දෙවියන් වහන්සේ ලෝක ගැලවුම්කරුවාණන් වූ ජේසුස් වහන්සේ මෙලොවට එවීමට ජාතියක් බිහි කිරීමට කැඳවනු ලැබුවේ.

1. ජාකොබ් තුමා ය
2. ආබ්‍රහම් තුමා ය
3. දාවිත් රජතුමා ය
4. ස්නාවක සුවාමි තුමා ය

4) " අඳන දෙකක් ඇති අය නැති අයට දේවා" මෙම උපදේශය ජනතාවට ලබා දුන්නේ,

1. ජේසුස් වහන්සේය
2. ස්නාවක ජොහාන් තුමායි
3. ශු පාවුලු තුමාය
4. ශු පේදුරු තුමාය

5) ස්නාවක ජොහාන් තුමා එදා සමාජයේ පූජා නායකයන් දුටුවේ.

1. බැටලුවන් ලෙස
2. එළුවන් ලෙස
3. පොළොඟුන් ලෙස
4. ඔටුවන් ලෙස

6) ජේසුස් වහන්සේ තමන් ඇති දැඩි වූ නාසරෙත් නුවර ධර්ම ශාලාවට වැඩම කර කියවන ලද ග්‍රන්ථය වන්නේ,

1. යෙසායා
2. ගීතාවලිය
3. වීරාවලිය
4. දානියෙල්

7) දේව රාජ්‍ය පිළිබඳව උපමාවක් වන්නේ,

1. වපුරන්නාගේ උපමාව
2. කරුණාවන්ත පියාගේ උපමාව
3. නැතිවූ බැටළුවා පිළිබඳ උපමාව
4. කන්‍යාවන් දසදෙනා පිළිබඳ උපමාව

8) සම්දාණන් වහන්සේගේ භෝජනය නුසුදුසු ලෙස වැළඳීමෙන් වළකින ලෙස ශුද්ධවූ පාවුළු තුමා උපදෙස් දුන්නේ,

1. කොරින්ති සංඝයට ය
2. එපීස සංඝයට ය
3. ගලාති සංඝයට ය
4. කොලොස්සි සංඝයට ය

9) ශුද්ධාත්ම ඵලය කි.

1. දේව භව
2. තේරුම් ගැනීම
3. ධෛර්යය
4. ස්නේහය

10) විශ්වය ශුද්ධවන්ත කිරීමේ කාර්යය වී ඇත්තේ,

1. පියාණන් වහන්සේට ය
2. ශුද්ධාත්මයාණන් වහන්සේට ය
3. පුත්‍රයාණන් වහන්සේට ය
4. අපෝස්තුළුවරුන්ට ය

11) මිනිපිට ශුද්ධවූ ත්‍රිත්වයේ සංකේතය වන්නේ,

1. දිව්‍ය යාගයයි
2. දේවස්ථානයයි
3. කිතුනු සභා එකමුතුවයි
4. කිතුනු පවුලයි

12) කතෝලික විශ්වාසයට පටහැනි ක්‍රියාවන් නොවන්නේ,

1. නුවාන පැවැත්වීම
2. හූනියම් කිරීම
3. ලග්න පලාපල බැලීම
4. ජේන ඇසීම

13) අති උතුම් XII පියුස් ශුද්ධෝත්තම පියතුමා විසින් නිකුත් කළ විශ්ව ලේඛනයකි

1. වෙහෙසෙන මිනිස්සු
2. දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝය
3. බලාපොරොත්තුවේ එළිපත්ත
4. ලෝක සාමය

14) ඉශ්‍රායෙල් ජනයා බබිලෝනියාවි වහලුන් බවට පත්වූයේ,

1. මිථ්‍යා ඇදහිලි අනුගමනය කළ නිසා
2. දෙවියන් වහන්සේට අකීකරු වූ නිසා
3. සහෝදරයා සමඟ අමනාප වූ නිසා
4. දෙවියන් වහන්සේට විරුද්ධව බොරු කී නිසා

15) අපෝස්තුළුවරුන් වෙන ශුද්ධාත්මයාණන් වැඩම කළ දිනය හඳුන්වන්නේ,

1. ස්වර්ගාරෝහණ දිනය
2. පාස්තු දිනය
3. පෙන්තකොස්ත දිනය
4. කැපකිරීමේ දිනය

16) උත්ථාන වීමෙන් පසු ජේසුන් වහන්සේ දර්ශනය වූ පුද්ගලයකු වන්නේ,

1. ස්තේපන්තුමා
2. පේදුරුතුමා
3. තෝමස්තුමා
4. පිලිප්තුමා

17) ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේ දී ස්ථාපිත කරන ලද දේව ප්‍රසාද නිධානය වන්නේ,

1. ප්‍රසාද ස්නාපනයය
2. දිව්‍ය සත්ප්‍රසාදය
3. අභිවෘද්ධි ආලේපය
4. රෝගීන්ගේ ආලේපය

18) ශුද්ධවූ සභාවේ නිල යැදුම ලෙස හඳුන්වන්නේ,

1. ස්තෝත්‍ර යාගිත යැදුම
2. පඬුරු මත යැදුම
3. බොදුනින් පසු යැදුම
3. යාම යැදුම

19) දිව්‍ය පූජාවේ පිලිවෙත් ගණන

1. 4 කි
2. 5 කි
3. 6 කි
4. 7 කි

20) දේව වාක්‍ය පිලිවෙතට අයත් කොටසක් වන්නේ,

1. බොදුනින් පසු යැදුම
2. පියතුමාගේ දේශන
3. පඬුරු පෙරහැර
4. සාමය පැතිම

## II කොටස

- **පළමු ප්‍රශ්නය** හා තවත් **ප්‍රශ්න 4 ක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

01) I. ලූක් සුබාරංචිය හඳුන්වන වෙනත් නම් හතරක් ලියන්න.

II. යෙසායා ග්‍රන්ථයට අනුව මෙසියස් වහන්සේට පැවරී තිබූ දූත කාර්යයන් හතරක් ලියන්න.

III. ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය වර්ග හතර නම් කරන්න.

IV. ශුද්ධාත්ම ඵල හතරක් ලියන්න.

V. දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් 2ක නම් කරන්න.

(ලකුණු 4x5=20)

02) I. "තියෝපිලස් " යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 2)

II. ලූක් තුමාගේ රැකියාවක් තුනක් ලියන්න, (ලකුණු 3)

III. ලූක් තුමාගේ ජීවිතයෙන් ගතහැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 5)

03) I. ශුද්ධාත්ම දීමනා දෙකක් ලියන්න. (ලකුණු 2)

II. අභිවෘද්ධි ආලේපය ලැබීමට අවශ්‍ය සුදුසුකම් තුනක් ලියන්න. (ලකුණු 3)

III. අභිවෘද්ධි ආලේපය ලැබූ දරුවකු ලෙස ඔබ පාසල තුළ කිස්තුස් වහන්සේ හඳුන්වා දීමට කරන ක්‍රියාකාරකම් පහක් ලියන්න. (ලකුණු 5)

04) I. දේව වන්දනාව යනු කුමක්ද? (ලකුණු 2)

II. ජන වන්දනාවේ ප්‍රධාන අංග තුනක් ලියන්න, (ලකුණු 3)

III.ජන වන්දනා අංග සඳහා ඔබට අර්ථාන්විතව දායක විය හැකි ආකාර පහක් ලියන්න. (ලකුණු 5)

05) I. රූප වන්දනාව යනු කුමක්ද? (ලකුණු 2)

II. ඔබ දන්නා සාන්තුවරුන් තිදෙනකු ලියන්න. (ලකුණු 3)

III. ශුද්ධවන්තයින්ගේ ආදර්ශ අනුව ඔබට කළ හැකි දේවල් 5ක් ලියන්න. (ලකුණු 5)

06) පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. දස පනත II. දේව ප්‍රසාද නිධාන

III. ශු ලූක් තුමා IV. ශුද්ධාත්ම ආගමනය

(ලකුණු 5x2=10)